**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 27 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 26 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබුණු ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.2,153,789 ක් සමාලෝචිත වර්ෂයේ අය ශීර්ෂයෙන් ඉවත් කොට සමුච්චිත අරමුදලට බැරකර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,153,789 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාව වෙත ලැබී තිබූ උපලේඛණ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, 2009 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා කාලයට අදාලව උසාවි දඩ රු.5,623,011 ක් හා 2012 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව මුද්දර ගාස්තු රු.326,280 ක් ලෙස එකතුව රු.5,949,291 ක් ලැබිය යුතුව පැවතියද, ආදායම් ණයගැතියන් යටතේ ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස රු.2,500,000 ක් පමණක් ගිණුම්ගත කර තිබීම නිසා එදිනට ආදායම් ණයගැති ශේෂය සහ සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය රු.3,449,291 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 9,213,393 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,613,497 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු.1,463,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පැවරුම් නියෝග, හිමිකම් ඔප්පු හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 හා 218 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කරවීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 880 සහ ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අංක 2/මු/1 හා 2005 මාර්තු 24 දිනැති ලිපිය | ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ, විශ්‍රාම ලැබූ, සේවය හැර ගිය හා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකළ සේවකයින් 10 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.19,575 ක් අයකර ගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.741,348 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.678,400 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු.62,948 ක් විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.62,948 ක ශුද්ධ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 2,792,435 | 2,840,403 | (47,968) | |
| බදු කුලී | 438,412 | 2,016,795 | (1,578,383) | |
| බලපත්‍ර ගාස්තු | 264,280 | 252,115 | 12,165 | |
| සේවා සඳහා ගාස්තු | 1,384,974 | 1,001,910 | 383,064 | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 2,507,537 | 2,698,586 | (191,049) | |
| වෙනත් ආදායම් | 643,913 | 491,878 | 152,035 | |
| ආදායම් ආධාර | 11,474,755 | 10,663,819 | 810,936 | |
| | | | ------------- | (459,200) |

පුනරාවර්තන වියදම
---------------------

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා දීමනා | 14,167,946 | 13,551,899 | (616,047) | |
| ගමන් වියදම් | 269,381 | 216,538 | (52,843) | |
| සැපයුම් හා උපකරණ | 1,644,437 | 1,690,538 | 46,101 | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 554,025 | 623,191 | 69,166 | |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 1,893,056 | 2,345,478 | 452,422 | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 34,962 | 13,638 | (21,324) | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 186,703 | 830,991 | 644,288 | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 14,448 | 14,833 | 385 | |
| | | | ----------- | 522,148 |
| | | | | ----------- |
| | | ශුද්ධ වැඩිවීම | | 62,948 |
| | | | | ======== |

2.3 **ආදායම් පරිපාලනය**
---------------------

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
-------------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති හිඟයෙන් අයකිරීමේ ප්‍රගතිය සියයට 56 ක් වූ අතර, වර්ෂයේ බිල්කළ ආදායමින් අයකිරීමේ ප්‍රගතිය සියයට 62.5 ක් විය.

2.3.2 **වරිපනම් බදු**
--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තිය ප්‍රකාරව එක් එක් ප්‍රදේශවල සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන වෙනස්වන බදු ප්‍රතිශතයන් නියම කරනු ලැබිය හැකි වුවද, සභාව විසින් බදු අයකරනු ලබන සියළුම නිශ්චල දේපල සඳහා 12% ක වරිපනම් බදු අයකෙරෙමින් පැවතිනි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.2,500,000 ක් ලැබිය යුතුව තිබුණි.

2.3.4 වෙනත් ආදායම්
--------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුල දුරකථන සන්නිවේදන කුළුණු 03 ක් ඉදිකර තිබූ නමුත්, එවැනි කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන ගිය උඩවෙල ජල සම්පාදන ක්‍රමය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පැවරීමේ අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව සභාවට පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතුව පැවති රු.604,382 ක හිඟය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා එම මුදල එම ආයතනයෙන් සභාවට අයකර ගතයුතු වුවද, එසේ අයකර නොගෙන සභාවේ හිඟ ආදායම් යටතේ පෙන්වා තිබුණි.

(ඇ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ක්‍රියාවලීන් විධිමත් සමීක්ෂණයක් මඟින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විධිමත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව සභාව තීරණය කල රු.3,000 ක මාසික කුලී මුදලකට සභාව සතු ඉඩම් කොටසක් 2008 ජනවාරි සිට බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලබාදී තිබූ අතර එදින සිට 2013 සැප්තැම්බර් දක්වා කාලයට අදාලව ලැබිය යුතු රු.150,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛණය සමඟ තථ්‍ය දත්තයන් සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම ප්‍රතිශතය | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 779,908 | 2,792,434 | 2,012,526 | 258.0 |
| කුලී | 514,737 | 438,412 | 76,325 | 14.8 |
| බලපත්‍ර ගාස්තු | 216,000 | 264,280 | 48,280 | 22.3 |
| සේවා සඳහා ගාස්තු | 1,657,000 | 1,384,974 | 272,026 | 16.4 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 7,012,000 | 2,507,537 | 4,504,463 | 64.2 |
| වෙනත් ආදායම් | 610,000 | 643,913 | 33,913 | 5.5 |
| ආදායම් ආධාර | 11,118,000 | 11,474,755 | 356,755 | 3.2 |
| ප්‍රාග්ධන ආධාර | 51,500,000 | 6,819,233 | 44,680,767 | 86.7 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| වැටුප් හා වේතන | 14,318,000 | 14,167,945 | 150,055 | 1.0 |
| ගමන් වියදම් | 360,000 | 269,381 | 90,619 | 25.1 |
| සැපයුම් හා උපකරණ | 1,615,000 | 1,644,437 | 29,437 | 1.8 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,070,000 | 554,025 | 515,975 | 48.2 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 3,473,000 | 1,893,056 | 1,579,944 | 45.4 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 10,000 | 34,961 | 24,961 | 249.6 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 435,000 | 186,703 | 248,297 | 57.0 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 25,000 | 14,448 | 10,552 | 42.2 |
| ප්‍රාග්ධන වියදම් | 52,000,000 | 8,713,527 | 43,286,473 | 83.2 |

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පරිපාලනය